**ශීර්ෂය - 06 රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 06 - රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 20 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් නොවන ලැබීම්**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් කොමිෂන් සභාව විසින් එකතු කර තිබූ රු.9,534,266 ක්වූ ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් ලෙස දක්වා තිබුණි. | අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරන ආයතනය විසින් එකතු කරන ලද රු.9,534,266 ක් වූ ආදායම් ඒසීඒ 7 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ නිවැරදිව දක්වා ඇතත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ ප්‍රමාද දෝෂයකින් ආදායම් නොවන ලැබීම් ලෙස දක්වා ඇත. | අදාල ආකෘතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |

**(ආ) දේපළ පිරියත හා උපකරණ**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණයන්හි එකතු වටිනාකම රු.854,113,318 ක් වුවත්, කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එය රු.809,113,318 ක් ලෙස රු.45,000,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව දේපළ පිරියත හා උපකරණ සංචිත | මුදල් අමාත්‍යාංශයෙන් ලබාගත් මෝටර් රථයේ රු.50,000,000 ක්වූ වටිනාකම CIGAS වෙබ් යෙදවුමෙහි ඇතුලත් කිරීමේදී රු.5,000,000 ක් ලෙස ඇතුළත් වී තිබීමෙන් ඇතිවූ දෝෂය මෙම වෙනසට හේතු වේ. මේ වන විට එම වාහනය නැවතත් අමාත්‍යාංශය වෙත පැවරීමට කටයුතු කර ඇති | දේපළ පිරියත හා උපකරණ වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| ශේෂය ද එම වටිනාකමෙන් අඩුවෙන් දැක්විණි. | අතර 2023 වර්ෂයේ ගිණුම් ප්‍රකාශ වලින් මෙම වෙනස නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇත. | |
| (ii) ඒසීඒ 06-මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවල ආරම්භක ශේෂය රු.32,500 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂය අවසානයට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ශේෂය රු.39,705,896.96 ක් ලෙස නිවැරදිව හඳුනාගෙන ඇතත් 2022 Cigss වැඩසටහනෙහි දක්වා ඇත්තේ ආරම්භක ශේෂය ලෙස රු.39,673,396.96ක් හා ආරම්භක ශේෂයට එකතුකිරීම් රු.32,500ක් ලෙස අගයන් දෙකක් වශයෙනි. මෙසේ සටහන් වීම පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ CIGAS වැඩ සටහන් අංශය දැනුවත් කර ඇත. | ඉකුත් වර්ෂයේ අවසාන ශේෂ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස නිවැරදිව දැක්විය යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැඳීම් වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇමුණුම III බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබූ වැය විෂයයන් තුනකට අදාල රු.1,609,362 ක බැරකම් 2023 වර්ෂයේ ප්‍රතිපාදන වලින් ගෙවා තිබුණි. ඉන් එක් වැය විෂයයකට අදාල බැරකමක් සමාලෝචිත වර්ෂයේ වියදමට ගැලපීමේදී ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවීම රු.494,532 ක් විය. | මෙම බැරකම් 2023 වර්ෂයේ ගෙවීම් සඳහා ඉදිරිපත් වූ වවුචර්පත් වේ. එබැවින් ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවීමක් සිදු වී නොමැති අතර විමසුමෙහි දක්වා ඇති දෙසැම්බර් මාසයට අදාල බිල්පත් ගෙවීම සඳහා වවුචර් පත් ලැබී ඇත්තේ ජනවාරි මාසයේ බැවින් බැරකම් ප්‍රකාශයට ඇතුලත් කර නොමැත. වර්ෂයට අදාල ගෙවීම් කිරීම සඳහා පමණක් ප්‍රතිපාදන වෙන් කර ඇති අතර එමගින් අතිරික්ත ප්‍රතිපාදන ඇතිවීම වලක්වා ගැනීමට කටයුතු කර ඇත. | වර්ෂයට අදාල සියළුම බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු අතර ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වල එළඹීමෙන් වැලකිය යුතු වේ. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ). | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 13.3 වගන්තිය | 2019 මාර්තු 01 දින සිට පුරප්පාඩුව පැවති කොමිෂන් සභාවේ පරිපාලන නිලධාරී තනතුර සඳහා විගණිත දිනය වූ 2023 මාර්තු 31 දින දක්වා එනම් වසර 4ක කාලයක සිට වැඩ බැලීමේ පදනම මතද , 2021 දෙසැම්බර් 09 දින සිට පුරප්පාඩුව පැවති ලේකම් තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත හා වැඩ බැලීමේ පදනම මතද නිලධාරින් පත්කර තිබුණු අතර එම තනතුරු ස්ථිරව පිරවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ සේවා අධි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පවත්වන ලද විභාගවල ප්‍රතිඵල අනුව ඉදිරියේදී බඳවා ගැනීමට නියමිත නිලධාරීන්ගෙන් පරිපාලන නිලධාරී තනතුර ස්ථිරව පිරවීමට කටයුතු කරමින් පවතී. 2023.04.17 දින පත්වූ නව කොමිෂන් සභාව විසින් ලේකම් තනතුර සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර ලේකම්වරයකු පත් කර ගැනීමට කටයුතු කරමින් පවතී. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කොමිෂන් සභාවේ සංචිත වාහන 3 ක් සම්බන්ධයෙන් පොදු 268 (අ) ආකෘතිය පිළියෙල කර නොතිබුණි. | ධාවන සටහන්වල පොදු 268(අ) ආකෘතිය පිළියෙල කළ යුතු ආකාරය පිළිබඳ රියදුරු මහතුන් දැනුවත් කර එය පිළියෙල කළ යුතු බවට ලිඛිතව දැනුම්දී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 වර්ෂයේදී කොමිෂන් සභාව වෙත ලැබී තිබූ ඉල්ලීම් වලින් 2023 අප්‍රේල් 28 දින වන විට ඉල්ලීම් 1,342 ක් සම්බන්ධයෙන් එක් එක් ආයතන වෙතින් තොරතුරු කැඳවා තිබුණු අතර ඉල්ලීම් 523 ක කටයුතු සිදු කරමින් පැවතුණි. 2020 සහ 2021 වර්ෂවල ලැබී තිබූ ඉල්ලීම් වලින් පිළිවෙලින් ඉල්ලීම් 07 ක හා 11 ක කටයුතු 2023 අප්‍රේල් 28 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. | කටයුතු ආරම්භ කර නොමැති ලෙස නිරීක්ෂණය වන ලිපි භෞතිකව ඒ ඒ අංශයන්හි නොපවතින අතර ලේඛණ කළමනාකරණ පද්ධතියට දත්ත ඇතුළත් කිරීමේදී ද්වි ගණනය වීම නිසා ඇතිවූ තත්ත්වයක් හෝ ප්‍රගමන පිටපත් හෝ ලිපියක පිටපතක් හෝ පොළිස් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති ලිපිගොනුවලට ඇතුළත් කරන ලද ලිපි හෝ විය හැකි බව නිරීක්ෂණය කරමි. | කොමිෂන් සභාව වෙත ලැබෙන ඉල්ලීම් සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කිරීමට පවතින බාධාවන් සහ වෙනත් දෝෂ හඳුනාගෙන කඩිනම් පිළියම් යෙදිය යුතුය. |
| (ආ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි 237 වන වගන්තිය ප්‍රකාරව, | අභියාචනා අංශය වෙත ලැබෙන බොහොමයක් අභියාචනා නිලධාරීන් විසින් ප්‍රමාදය වැලැක්වීම සඳහා ප්‍රගමන පිටපතක් වශයෙන් යොමු කරන අභියාචනා වන අතර එකී අභියාචනා සම්බන්ධයෙන් අදාල | කොමිෂන් සභාව වෙත ලැබෙන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට පවතින බාධාවන් හඳුනාගෙන පිළියම් යෙදිය යුතුය. |

| | | |
|---|---|---|
| කොමිෂන් සභාව වෙත යොමුකළ අභියාචනයක් කොමිෂන් සභාව වෙත ලැබී, ස්ථාන මාරු සම්බන්ධයෙන් දින 15ක් හා උසස් කිරීම් සම්බන්ධයෙන් දින 45 ක් ඇතුළත තීරණයක් කොමිෂන් සභාව විසින් ගනු ලැබිය යුතු වේ. එසේ වුවත් පරීක්ෂා කරන ලද අභියාචන ලිපිගොනු 21 න් ස්ථාන මාරු අභියාචනා 07 ක් සඳහා තීරණ ලබා දීමට දින 45 සිට දින 1,504 දක්වා කාලයක් ගත කර තිබුණු අතර එක් උසස් කිරීමේ අභියාචනයක් ලැබී වසර 2 කට වැඩි කාලයක් ගතවී තිබුණද විගණිත දිනය වූ 2023 පෙබරවාරි 20 දින වන විටත් ඒ සඳහා තීරණයක් ලබාදී නොතිබුණි. | අමාත්‍යාංශ වෙතින් නිරීක්ෂණ නිර්දේශ ඇතුළත් වාර්තා හා ලිපිගොනු ගෙන්වා ගැනීම සඳහා අභියාචනා අංශය මඟින් කඩිනමින් කටයුතු කරනු ලැබේ.<br>ඒ අනුව එකී වාර්තා හා ලිපිලේඛණ ලැබෙන තුරු ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කල නොහැකි වන අතර අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් ලබාදීමට ගතවන කාලය ඒ මත වෙනස් වන බවත් එය අංශයේ පාලනයෙන් බැහැරව පවතින කරුණක් වේ. | |

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 පෙබරවාරි 22 දිනට විවිධ වර්ගයේ ටෝනර් හා ඩ්‍රම් 116 ක් ගබඩාවේ පැවති අතර ඉන් 17 ක් 2020 වර්ෂයට පෙර මිලදී ගත් ඒවා වූ අතර 2020, 2021, 2022 හා 2023 වර්ෂවල පිළිවෙලින් 05 ක්, 12 ක්, 72 ක් හා 10 ක් වශයෙන් මිලදීගෙන තිබුණි. | මෙම ටෝනර්/ඩ්‍රම් මොඩල 33 කින් කාර්යාලයේ භාවිතා කරනු ලබයි. | ගබඩාවේ පවතින තොග ශේෂය පිළිබඳව සැලකිලිමත්ව ටෝනර් හා ඩ්‍රම් මිලදීගත යුතුය. |
| (ආ) | 2020 වර්ෂයට පෙර මිලදී ගෙන තිබූ වර්ග 03 කින් යුත් ටෝනර් 08 ක් භාවිතා කරන යන්ත්‍ර කොමිෂන් සභාවේ නොතිබීම හා ඉතා පැරණි යන්ත්‍ර වීම නිසා භාවිතය අවම වීම හේතුවෙන් එම ටෝනර් නිෂ්ක්‍රීයව පැවතුණි. | T Samsung ටෝනර් භාවිතා කරන ප්‍රින්ටර් 2016 වර්ෂයට පෙර කාර්යාලයේ තිබී ඇති අතර ඒ සම්බන්ධයෙන් සොයා බලමින් පවතී. T SharfAR 5318 ටෝනර් භාවිතා කරන ඡායා පිටපත් යන්ත්‍ර 02 ඉතා පැරණි බැවින් වැඩි භාවිතයක් සිදු නොවේ. | නිෂ්ක්‍රීයව පවතින ටෝනර් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| **(ඈ)** | 2020 ජනවාරි 01 දිනට T Brother 2150 වර්ගයේ එක් ටෝනරයක් ගබඩාවේ තිබියදී 2020 හා 2022 වර්ෂවලදී පිළිවෙලින් ටෝනර් 03 ක් හා 02 ක් මිලදීගෙන උපයෝජනයකින් තොරව පැවති අතර Brother 2140වර්ගයේ ඩ්‍රම් එකක් 2020 ජනවාරි 01 දිනට ගබඩාවේ පැවතියදී, 2021 වර්ෂයේ තවත් එවැනිම ඩ්‍රම් එකක් මිලදීගෙන උපයෝජනයකින් තොරව ගබඩාවේ පැවතුණි. | T Brother 2150 හා 2140 වර්ගයේ ටෝනර් භාවිතා කරන යන්ත්‍ර වරින් වර අලුත්වැඩියා කිරීමට සිදුවූ බැවින් හා දිගු කාලයක් ක්‍රියා විරහිතව පැවතීම හේතුවෙන් භාවිතය අවම වී ඇත. දැනට මෙම ටෝනර් භාවිතා කරනු ලබයි. | නිෂ්ක්‍රීයව පවතින ටෝනර් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ඇ) | කොමිෂන් සභාව සතු පිරිවැය රු.2,850,000 ක්වූ වාහනයක් 2020 ඔක්තෝබර් මාසයේ සිට විගණිත දිනය වූ 2023 මාර්තු 09 දින දක්වා ධාවනයෙන් තොරව ආයතන පරිශ්‍රයේ ගාල් කර තිබුණි. | මෙම මෝටර් රථය 2020 වර්ෂයේ සිට විටින් විට අළුත්වැඩියාවන් සඳහා යොමු කළද අවශ්‍ය අමතර කොටස් නොමැතිවීම හේතුවෙන් අළුත්වැඩියාවන් සාර්ථකව සිදු කිරීමට නොහැකි විය. එබැවින් මෙම රථය එලදායී ක්‍රමවේදයන් යටතේ අපහරණය කිරීමට යොජනා වී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | මෙම වාහනය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ). 2022 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ ජ්‍යෝෂ්ඨ මට්ටමේ ලේකම් තනතුර සහ තෘතීයිය මිට්ටමේ තනතුරු 04 ක, ද්විතීය මට්ටමේ එක් තනතුරක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 07 ක පුරප්පාඩු 13 ක් පැවති අතර විගණිත දිනය වූ 2023 මාර්තු 31 දින වන විටත් එම පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි. | 2023.01.01 දින සිට පුරප්පාඩු වූ ලේකම් තනතුරේ සහ තෘතීයිය මට්ටමේ තනතුරු දෙකක රාජකාරි වැඩ බැලීමේ පදනම මත සිදු කර ඇත. ඉදිරියේදී කාර්මික නිලධාරී තනතුරට පූර්ණකාලීනව බඳවා ගැනීමට කටයුතු කිරීමට සටහන් කරගෙන ඇත. භාෂා පරිවර්ථක සේවයේ පුරප්පාඩුව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇත. ලඝු ලේඛක තනතුරේ රාජකාරි කාර්ය මණ්ඩලයේ සිටින නිලධාරිනියක විසින් සිදු කරනු | කාර්යසාධනයට අහිතකර ලෙස බලපාන අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළයුතු වේ. |

| | | |
|---|---|---|
| | ලැබේ.ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 07 න් තනතුරු 04 ක රාජකාරි බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මගින් ආවරණය කරගෙන ඇත. | |
| (ආ) 2023 ජනවාරි 14 දිනට මාණ්ඩලික නිලධාරීන් 08 කගේ, කළමනාකරණ සේවා නිලධාරීන් 38 කගේ හා ප්‍රාථමික සේවා නිලධාරීන් 11 කගේ කොමිෂන් සභාවේ සේවා කාලය වසර 06 ඉක්මවා තිබුණි. ඉන් එක් කළමනාකරණ සේවා නිලධාරිනියකගේ කොමිෂන් සභා සේවා කාලය වසර 20 ඉක්මවා තිබුණි. | වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛ අනුව කොමිෂන් සභාවේ සේවා කාලය වසර 05 සම්පූර්ණ කරන ලද නිලධාරීන්ගේ තොරතුරු අදාල බලධාරීන් වෙත යොමු කර ඇත. සුවිශේෂී අවස්ථාවලදී සේවා අවශ්‍යතාවය මත කොමිෂන් සභාවේ ඉල්ලීම් හා ලේකම්ගේ තීරණය මත ඇතැම් නිලධාරීන් ස්ථාන මාරු සඳහා නොසලකන ලෙසට ඉල්ලීම් කර ඇත. | ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ඇ) 2018 වර්ෂයේදී කොමිෂන් සභාවේ ලේකම් තනතුර සඳහා අයදුම්පත් කැඳවීමේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් විශේෂ ශ්‍රේණියේ සේවා කාලයක් සඳහන් කර නොතිබුණද 2022 දෙසැම්බර් 01 දිනැතිව අනුමත කරගෙන තිබූ බඳවාගැනීමේ පටිපාටියේ බඳවාගැනීමේ සුදුසුකම්වල පළපුරුද්ද සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ වසර 08කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත වීම දක්වා තිබීම සුවිශේෂී තත්වයක් විය. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ මෙවැනි සේවා කාලයක් සහිත නිලධාරීන් සීමිත වීම නිසා 2022.12.14 දින ලේකම් තනතුරට බඳවාගැනීම සඳහා පළකර තිබූ පුවත්පත් දැන්වීමට ලැබී තිබුණේ අයදුම්පත් 08 ක් පමණි. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලේකම්වරයකු පත් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54.10 වගන්තිය අනුව එම කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යයක් බව සහ ඒ අනුව එම කොමිෂන් සභාව විසින් නිර්ණය කරනු ලබන ආකාරයකට ලේකම්වරයකු පත් කර ගැනීමට කටයුතු කළ බවත්, ඒ අනුව ලේකම් තනතුරට අදාල බඳවා ගැනීමේ පටිපාටිය සකස් කිරීම සහ ඒ සඳහා අදාල සුදුසුකම් නිර්ණායකයන් ඇතුළත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කර ඇත. | වැඩි නිලධාරීන් පිරිසකට අයදුම් කිරීමට හැකිවන පරිදි සුදුසුකම් සකස් කරගත යුතු වේ. |